## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය

## සිංහල/දෙමළ ( I, II, III, මට්ටම්)

## අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ මාර්ග ගත ක්‍රමයට පමණක් මෙම වාචික පරීක්ෂණයට අයදුම් කළ යුතු ය.

02. වසරේ ඕනෑම දිනක මෙම අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

03. විභාග අයදුම්කරුවන් විභාගයට අයදුම් කළ යුත්තේ තමාට අදාළ සේවා මට්ටමට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම සඳහා පමණි.

04. මෙම වාචික පරීක්ෂණයට අයදුම් කරන අවස්ථාව වන විට, ලිඛිත සුදුසුකම සපුරා තිබීම අනිවාර්ය වන අතර එම තොරතුරු නිවැරදිව අයදුම්පතෙහි ඇතුළත් කළ යුතු ය. අදාළ සහතිකය ශ්‍රවණ කුසලතා ඇගයීම් පරීක්ෂණයට පැමිණීමේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

05. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස විමසා ඇති කරුණු සඳහා අයදුම්කරුවන් විසින් වලංගු දත්ත ඇතුළත් කළ යුතු ය.

06. විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවෙකු නම්, ඒ පිළිබඳ විස්තර අයදුම්පත්‍රයෙහි සඳහන් කළ යුතු ය.

07. අයදුම්කරුවන්ගේ පහසුව පිණිස සිංහල භාෂාවෙන් ආදර්ශ අයදුම්පතක් මෙහි දක්වා තිබුණ ද මාර්ගගත අයදුම්පත්‍රය ඉංග්‍රීසි භාෂාවෙන් පළවන අතර, එය ඉංග්‍රීසි භාෂාවෙන් ම සම්පූර්ණ කළ යුතු වේ.

08. වාචික පරීක්ෂණය සඳහා අයදුම් කරන සෑම නිලධරයෙකු ම විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය. එක් එක් මට්ටමට අදාළ විභාග ගාස්තු පහත පරිදි වේ.

| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **10/2025** අනුව සේවා මට්ටම | අදාළ වන කාණ්ඩය | අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණ මට්ටම | ගාස්තුව (රු.) |
|---|---|---|---|
| තෘතියික/ජ්‍යෙෂ්ඨ | 1 | I මට්ටම | රු: 2000.00 |
| ද්විතීයික | 2 | II මට්ටම | රු: 1500.00 |
| ප්‍රාථමික | 3 | III මට්ටම | රු: 1000.00 |

09. විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "රාජගිරිය, ලංකා බැංකුවේ රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්ගේ අංක 7041541 දරන ගිණුමට" බැර කළ යුතු අතර, මුදල් ගෙවීමේ දී භාවිත කරන බැංකුවට අදාළ පෝරමයේ තැන්පත්කරුගේ නම සහ ලිපිනය සඳහන් කිරීමට ඇති ස්ථානයේ නම සහ ලිපිනයට අමතරව තැන්පත්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සමඟ "Oral Exam" යන්න ද සඳහන් කළ යුතු ය.

10. මුදල් ගෙවීමෙන් පසුව බැංකුව විසින් ලබා දෙන ලදුපතෙහි පරිගණකය ආශ්‍රිතව මුද්‍රිත වී ඇති අංකය (කොටස් හතරකින් යුත්) හා දිනය අයදුම්පතේ අදාළ කොටුව තුළ සඳහන් කළ යුතු ය.

11. අදාළ මුදල ගෙවූ බව සහතික කර ගැනීම සඳහා බැංකු රිසිට්පත ශ්‍රවණ කුසලතා ඇගයීම් පරීක්ෂණයට පැමිණීමේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ. විභාගයට සහභාගී වන අවස්ථාවේ මුල් පිටපත ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් නැවත මුදල් ගෙවීමට සිදුවනු ඇත.

12. විභාග ගාස්තුව වශයෙන් ගෙවන ලද මුදල් කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

13. අයදුම්කරු විසින් මාර්ග ගතව සම්පූර්ණ කරන දත්ත දෙපාර්තමේන්තුව මඟින් සංශෝධනය නොකරන බැවින් අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය.